# ජෙනිංග්ස් ද සංඝමිත්තා ද?

අපේ දැනුම යන්නෙන් අප අදහස් කරන්නේ පැරණි පොතපතෙහි සඳහන් දැනුම ම නො වෙයි. ඒ දැනුමෙන් යම් ප්‍රමාණයක් ඇතැම් විට විශාල ප්‍රමාණයක් අපේ දැනුම විය හැකි ය. ඒ කෙසේ වුවත් අපේ දැනුම යනුවෙන් අප අදහස් කරන්නේ අප විසින් නිර්මාණය කරනු ලැබූ දැනුම ය. එසේ නිර්මාණය කෙරුණු දැනුමට වෙනත් දැනුම් පද්ධතීන්ගෙන් අප විසින් අවශෝෂණය කරනු ලබූ දැනුම ද වෙයි. අප බොහෝ අවස්ථාවල සඳහන්කර ඇත්තේ අවශෝෂණයෙහි දී ද යම් නිර්මාණයක් සිදුවන බව ය.

නිර්මාණයක් නොවන්නේ අනුකරණයෙහි දී ය. අනුකාරකයා කරන්නේ වෙනත් දැනුම් පද්ධතියක ඇති දෙයක් එලෙසින් ම ගැනීම ය. එසේ වෙනත් දැනුම් පද්ධතියකින් ගන්නා දැනුම සිංහලෙන් ලියූ පමණින් හෝ කී පමණින් හෝ ඒ අපේ දැනුමක් බවට පත් නො වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා සිංහලෙන් නවකතා ලිවී ය. එහෙත් ඒ නවකථාවල ඇත්තේ රුසියන් අච්චුව ය.  ඒ අතර ඒ මහතා සිංහලෙන් ප්‍රංශ කෙටිකතා ලිවී ය. එයින් අදහස් කරන්නේ ප්‍රංශ කෙටිකතා අනුකරණය කරමින් සිංහලෙන් කෙටිකතා ලියූ බව ය.

එපමණක් නො වෙයි. ඒ මහතා ඊනියා සමාජවාදී විකාශයක් කෙරෙහි ද විශ්වාසය තැබී ය. ඒ මහතා මාක්ස්වාදය හෝ අපෝහක භෞතිකවාදය ( ද්‍රව්‍යවාදය - materialism) නිවැරදිව තේරුම් ගෙන නොසිටිය ද තමන් දත් අයුරින් ඊනියා යථාර්ථවාදයක් සමග ඒ මුසු කරමින් තම නවකතාවල හා කෙටිකතාවල දර්ශනය කරගත්තේ ය. ඒ නිර්මාණයක් නොව අනුකරණයක් විය. ඊනියා යථාර්ථවාදීන් යැයි කියන බොහෝ දෙනෙක් ඒ මග ගත්හ. බටහිර කෙටිකතා හා නවකතා අනුකරණය කිරීම මාර්ටින් වික්‍රමසිංහ මහතා වසා ගත්තේ කෙටිකතාව ජාතක කතාව සමග සංසන්දනය කිරීමෙනි. එවිට බටහිර කෙටිකතාව අනුකරණය කළ සිංහල කෙටිකතාව ජාතක කතාවේ ම විකාශයක් ලෙස "පෙන්නුම් කිරීමට" හැකිවිය. එහෙත් ඒ ව්‍යාජයක් ම විය.

අපේ දැනුම පැරණි දැනුමක් බවට පත්කළ උගත්තු, එනම් යම් ආකාරයක බටහිර අධ්‍යාපනයක් ලත් උගත්තු, බටහිර දැනුම නූතන දැනුම ලෙස ගනිමින් අපේ දැනුමට ගෞරව කරමින් ඒ පිළිබඳ ආඩම්බර වෙමින් ඒ අපේ ඊනියා දැනුම බටහිර ඊනියා නූතන දැනුම සමග හැලපීමට උත්සාහ ගත්හ. එහෙත් සියළු බටහිර උගතුන් එවැන්නක් කෙළේ යැයි මෙයින් නො කියැවෙයි. ඇතැම් බටහිර උගතුන්ට අපේ දැනුමෙහි ගතයුතු තරම් දෙයක් නො වී ය. අද ද මේ ප්‍රවණතා දෙක දැකිය හැකි ය. බටහිර පශ්චාත් නූතනවාදී යැයි කියන නවකතා කෙටිකතා ආදියෙහි අධියථාර්ථවාදය, ඉන්ද්‍රජාලික යථාර්ථවාදය ආදිය ජාතක කතාවෙහි ඇතැයි කියන්නෝ වෙති. ඒ අතර එවැන්නක් ජාතක කතාවෙහි නැතැයි ද, එසේ ඇතැයි සිතීම ම අතීතකාමී ක්‍රියාවක් යැයි ද කියන්නෝ වෙති.

අපට අවශ්‍ය වන්නේ ජාතක කතාවෙහි ඇත්තේ හෝ නැත්තේ හෝ කුමක් දැයි බටහිර මිනුම් දණ්ඩකට අනුව මැනීම නොව අපේ ම මිනුම් දඬු සොයා ගෙන දැනගැනීම ය. එය ජාතක කතා බටහිර සමග සංසන්දනය කරනවාට වඩා අමාරු කාර්යයකි. එහෙත් එපමණින් ඒ නොකර සිටිය හැකි නො වෙයි. අද මෙරට සෑම දෙනකුට ම ලැබෙන්නේ බටහිර අධ්‍යාපනයකි. බටහිර දැනුම එකම දැනුම, නූතන දැනුම ලෙස සැලකීමට පුරුදු වී සිටින සංඛ්‍යාව මාර්ටින් වික්‍රමසිංහ මහතා ජීවතුන් අතර සිරි කාලයෙහි එසේ සැලකූ ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩි ය. මෑතක් වන තුරුම, එනම් විද්‍යුත් ජනමාධ්‍ය විසින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ආක්‍රමණකාරීව ප්‍රචලිත කිරීම ආරම්භ කරන තෙක් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දැනුම ජනතාව අතරට ගෙනගිය ප්‍රධාන ආයතන වූයේ පාසල් හා විශ්වවිද්‍යාල ය.

ඉන්දියාවේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වකරණයට ගොදුරු වූ විශාල පිරිසක් නගරවල වාසය කරති. සංඛ්‍යාව ලෙස ගතහොත් මේ පිරිස ලංකාවේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වකරණයට ගොදුරු වූ පිරිසට වඩා ඉතා විශාල ය. එහෙත් ජනගහණයේ ප්‍රතිශතයක් ලෙස ගතහොත් ඒ පිරිස ලංකාවේ මෙන් නොව සුළුතරයකි. මේ තත්වය දිගට ම පවතී යැයි මෙයින් නො කියැවෙයි. රූපවාහිනී නාලිකාවල ව්‍යාප්තියත් සමග ඉන්දියාවේ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වකරණයට භාජනය වන්නන්ගේ සංඛ්‍යාව ඉහළ යනු ඇත.

© Prof. Nalin De Silva

එහෙත් ලංකාවේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වකරණයට ගොදුරුවූවන්ගේ ප්‍රතිශතය රූපවාහිණී ආක්‍රමණයට පෙර ද විශාල විය. එයට ප්‍රධාන හේතුව බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනය මෙරට ප්‍රචලිත වීම ය. ඉන්දියාවේ බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනය ලංකාවේ තරම් ප්‍රචලිත නො වී ය. ලංකාවේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අධ්‍යාපනය එතරම් ප්‍රචලිත වූයේ නිදහස් අධ්‍යාපනය නිසා ය. ඒ බව බොහෝ දෙනකුට ඉතා අම්හිරි දෙයක් විය හැකි ය. එහෙත් අපට එයට පිටුපෑමට නො හැකි ය. අපට නිදහස් විය හැක්කේ අපට සිදු වී ඇත්තේ කුමක් දැයි අප අපේ ඇසින් බලා අවබෝධ කරගන්නා තරමට ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අධ්‍යාපනය ගම්වලට යෑමට පෙර තිබූ ගම හා ඉන් පසුව ඇති වූ ගම අතර වෙනසක් නැතැයි කිවහැකි ද?

ඇතැමුන්ට අනුව ගම වෙනස් වූයේ විවෘත ආර්ථිකය හඳුන්වාදීමෙන් පසුව ය. එහෙත් 1977 වන විට මෙරට ජනයාගේ අඩුම තරමින් තරුණයන්ගේ ආකල්ප වෙනස් වී තිබිණි. ජනතාව 1977 දී ඡන්දය දුන්නේ ස්වයං පෝෂිත වීමට, අඩුම තරමින් ආහාරයෙන් ස්වයං පෝෂිත වීමට දැරූ තැතකට විරුද්ධව ය. ඒ ස්වයං පෝෂිත වීමට දැරූ තැතෙහි වැරදි අඩුපාඩුකම් නොතිබුණා නො වෙයි. එහෙත් ජනතාවට අවශ්‍ය වූයේ ඒ අඩුපාඩුකම් නැතිකර ගැනීම නොව බටහිර දියුණුව පසුපස යන දියුණුවකි. විවෘත ආර්ථිකය ඉල්ලා ඡන්දය දීමට ජනතාව මෙහෙයවනු ලැබුයේ ඔවුන්ගේ ආකල්ප ඒ වන විට බෙහෙවින් වෙනස්කර තිබූ නිසා ය.

නිදහස් අධ්‍යාපනය ගැන මේ ලිපි පෙළෙහි බොහෝ දේ ලියා ඇත. බටහිරයන් පැමිණීමට බොහෝ කලකට පෙර ද මෙරට නිදහස් අධ්‍යාපනය සියළු දෙනාට තිබූ බවත් කාන්තාවන් ද ඒ අධ්‍යාපනය ලබාගත් බවත් කීවෙමු. කන්නන්ගර මහතාට නිදහස් අධ්‍යාපනය පිළිබඳ සංකල්පය ඇතිවන්නට ද හේතුව අපේ සම්ප්‍රදායෙහි ඒ සංකල්පය තිබීම විය හැකි යැයි කීවෙමු. එහෙත් අපට ප්‍රශ්නයක් විය. නිදහස් අධ්‍යාපනය ඔස්සේ රටට ලැබුණේ කාගේ අධ්‍යාපනයක් ද යන්න ඒ ප්‍රශ්නය විය. නිදහස් අධ්‍යාපනය හඳුන්වාදුන් අවධියෙහි ඒ ප්‍රශ්නය ඇසූ අයකු සිටියේ දැයි නො දනිමු. ඉතා පැහැදිලිව ම නිදහස් අධ්‍යාපනය හා මධ්‍ය මහා විද්‍යාල ඔස්සේ රටට ගියේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අධ්‍යාපනයකි. එතෙක් නගර කිහිපයකට සීමා වී තිබූ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආකල්ප බොහෝ ප්‍රදේශවලට ගලා ගියේ නිදහස් අධ්‍යාපනයෙන් හා මධ්‍ය මහා විද්‍යාල ඇතිකිරීමෙන් පසුව ය.

නිදහස් අධ්‍යාපනයෙන් මා ද ඇතුළු පුද්ගලයන් පිරිසකට පෞද්ගලිකව ගත්කල බටහිර සංකල්පවලට අනුව සමාජයීය හිණිමගේ ඉහළට යෑමට අවස්ථාව ලැබී ඇත. එහෙත් එපමණකින් අප ඉන් සමස්තයක් ලෙස ගත්කල රටට සිදු වී ඇත්තේ කුමක් දැයි කල්පනා නොකර නොසිටිය යුතු ය. පොදුවේ ගත්කල රටට ඉන් සිදු වී ඇත්තේ කුමක් ද? නිදහස් අධ්‍යාපනය ලැබුවන්ගෙන් අර හිණිමගේ ඉහළට නැංගේ කිහිප දෙනකු බව පැහැදිලි ය. රටට කෙසේ වෙතත් ඒ අයට නම් පෞද්ගලිකව ගත්කල බටහිර මිනුම් දඬු අනුව සෙතක් වී ඇත. එහෙත් විශාල බහුතරයකට හා රටට සිදු වූයේ අල්ලපු අත්තත් පයගහපු අත්තත් යන දෙකම නැතිවීම ය.

බටහිර දැනුම ලබාදීම සඳහා පිහිටුවනු ලැබූ ලංකා විශ්වවිද්‍යාලය ඔක්ස්ෆර්ඩ් කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල අනුකරණය කරමින් බිහිකෙරිණි. විශ්වවිද්‍යාලය පේරාදෙණියට ගෙනයෑමේ දී අර දෙබිඩි බව නැවතත් මතු විය. බාහිරව ඇම්බැක්කේ කැටයම් ප්‍රදර්ශනය කෙරුණේ අපේ ඊනියා පැරණි දැනුමට (ශිල්පීය) ගරුකරමිනි. එහෙත් අභ්‍යන්තරයේ උගන්වනු ලැබුයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව දැනුම ය. එහි ශාලාවක් විශ්වවිද්‍යාලයෙහි පළමු උපකුලපති අයිවෝර් ජෙනිංග්ස් මහතා නමින් හැඳින්වීම කිසිසේත්ම අමනොඥ ක්‍රියාවක් නො වෙයි. එහෙත් අපට තේරුම් ගත නොහැක්කේ පේරාදෙණි විශ්වවිද්‍යාලයෙහි ශාලාවක් සංඝමිත්තා ලෙස නම්කිරීම ය. මේ නම්කිරීම කර ඇත්තේ සංඝමිත්තා මෙහෙණින් වහන්සේගේ නමින් දැයි නො දනිමු. එසේ නම් එහි ඇත්තේ නො ගැලපීමකි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රධාන බලකොටුවක අයිවෝර් ජෙනිංග්ස් මහතාගේ නම ප්‍රදර්ශනය වීම උචිත ය. එහෙත් එහි සංඝමිත්තා මෙහෙණින් වහන්සේගේ නම ප්‍රදර්ශනය කෙරන්නේ ඇම්බැක්කේ කැටයම් ප්‍රදර්ශනය කෙරෙන පදනමෙන් ද?

කන්නංගර මහතා සද්භාවයෙන් ඇරඹුව ද නිදහස් අධ්‍යාපනය නිසා සිදු වී ඇත්තේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදය තව තවත් තහවුරු වීම ය. පෘතුගීසීන් පැමිණි දින සිට බටහිර යටත්විජිතවාදයේ එක් සංරචකයක් වූ සංස්කෘතික යටත්විජිතවාදය ද ක්‍රමයෙන් ප්‍රචලිත විය. එහෙත් ඉංගිසින් ද ඇතුළු බටහිරයන්ට සිංහල බෞද්ධ

© Prof. Nalin De Silva

සංස්කෘතිය දුර්වල කිරීමට එතරම් දෙයක් කළ නොහැකි විය. භික්ෂූන් වහන්සේගේ නායකත්වයට ප්‍රබල අභියෝගයක් එල්ල කිරීමට බටහිරයන්ට නො හැකි විය. ඉංගිරිසින් නායක පදවි දීම් හා වෙනත් උපක්‍රම ඔස්සේ භික්ෂූන් වහන්සේ මිළ දී ගැනීමට සූදානම් වුව ද භික්ෂු නායකත්වය නගර කිහිපයක කෙසේ වෙතත් ගම්වල රැඳී තිබුණි. භික්ෂු නායකත්වය ගම්වලින් ද ශීඝ්‍රයෙන් නැති වී යෑම ඇරඹුණේ නිදහස් අධ්‍යාපනය ඔස්සේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යය ගම්වල ද තහවුරුවීම සමග ය. භික්ෂූන් වහන්සේ වියත්කදුන් ලෙස සැලකූ සමාජයට නව වියත්කදුන් ලැබිණි. මේ නව වියත්කදුහු ඉංගිරිසිහු නො වූහ. ඔවුහු අර බටහිර අධ්‍යාපනයෙන් ම ඉහළට නැගගත් ඊනියා ප්‍රකට විද්වත්හු හා ඔවුන්ගේ ගෝල බාලයෝ ම වූහ. මේ විද්වතුන් භික්ෂූන් වහන්සේට ගෞරව නොකළා නො වේ. ඔවුහු ඇම්බැක්කේ කැටයම්වකට ද ගරු කලහ ; ගරු කරති. එපමණක් නො වේ. ඇම්බැක්කේ කැටයම් ගැන ඊනියා ශාස්ත්‍රීය පර්යේෂණ පත්‍රිකා ද පළ කරති. එමගින් අර හිණිමගේ තව තවත් ඉහළට නගිති.

ඉංගිරිසින්ට හා අනෙක් බටහිරයන්ට එතරම් හොඳින් නොකළ හැකි වූ දේ ඔවුහු තම අධ්‍යාපනයෙන් බිහිකරගත් පුද්ගලයන් ලවා ඉතා මැනවින් ඉටුකර ගත්හ. දැනුදු ඉටුකර ගනිති. අපට අවශ්‍ය භික්ෂූන් වහන්සේ නැවතත් වියත්කදුන් බවට පත්කර ගැනීම ය. සද්භාවය තිබූ පමණින් ඒ කළ නො හැකි ය. කන්නංගර මහතා මෙන් ම වෙනත් බොහෝ අය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සිර වී සිටිය හ. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට, එහි සංස්කෘතික යටත්විජිතවාදී සංරචකයට අභියෝග කර ඒ පරාජය කළ යුතු ය. ඒ පරාජය කළ හැකි චින්තනයක් වෙන කාහටත් වඩා සිංහල බෞද්ධයන්ට ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva